සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය.ය | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි:**

- ♦ උපදෙස් දී ඇති පරිදි ප්‍ර ශ්න පහකට පමණක් උත්තර ලියන්න.
- ♦ 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍ර ශ්න වලින් එකකටත් උත්තර ලියන්න.
- ♦ මෙම ප්‍රශ්න පත්‍ර යට හිමි ලකුණු ගණන 80 කි.

(01) ( i ) සිට ( x ) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණේ කිනම් සාහිත්‍ය යුගයකදී ද ?
(ආ) එකල රාජ්‍යත්වය දැරූ රජතුමා කවුරුන් ද?

( ii ) (අ) ජාතක කතා පොතට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථය නම් කරන්න.
(ආ) සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතියේ ඇති ලක්ෂණ තුන කවරේද?

( iii ) (අ) ජාතක පොත සිංහලයට නැගුණු පසු වෙන් වෙන් වශයෙන් ලියවුණු ජාතක කතාවක් නම් කරන්න.
(ආ) ජාතක කතා පොත ඇසුරෙන් ලියවුණු කාව්‍ය ග්‍රන්ථයක් ලියන්න.

( iv ) " කේවට්ටය,තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය යැයි සිතයි ද?දැන් ම සකන් වැ ගියේය."
(අ) සතර කන් මන්ත්‍රණයට සම්බන්ධ වූ දෙදෙනා කවුරුන් ද?
(ආ) එය දැන් ම සකන් වැ ගියේ කෙසේ ද?

( v ) "ආචාරිනී ඒ උපාය ඉතා යහපත,සෙට උදැසන ධර්ම යුද්ධ වන්නේ ය.ඉදින් ධර්ම යුද්ධයට නො අවු නම් එයිත් පැරුද්දා නම් වන්නේ යැ"
(අ) මෙසේ පණිවිඩය යවන්නේ කාට ද?
(ආ) "ධර්ම යුද්ධය" නමින් හඳුන්වා ඇත්තේ කුමක් ද?

( vi ) (අ) ගුත්තිල කාව්‍ය ය ලිවීමට මූලාශ්‍රය කොට ගත් ජාතක කතාව කුමක් ද ?
(ආ)ගුත්තිල කාව්‍යයරචනා කිරීම අරඹා ඇත්තේ කිනම් කාව්‍යර ගණයකින් ද?

( vii ) (අ) වැත්තෑවේ හිමියන්ගේ ගුරු හාමුදුරුවන් කවුරුන් ද?
(ආ) ගුරු හාමුදුරුවන් වැත්තෑවේ හිමිට අප්‍රවසාදය පළ කිරීමට යෙදූ උපක්‍රමය කුමක් ද?

( viii ) දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
.....................................................................

(අ) මෙහි ඉතිරි කවි පාදය සම්පූර්ණ කරන්න.
. (ආ) දිය, දිය ගොස යන පදවල අර්ථ දක්වන්න.

(ix) සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) පිල්බර ගණ නොසතුටු වීමට හේතුව කුමක් ද?
(ආ) අර්ථ දක්වන්න.
- පිල්බර -
- සඳැස් -

(x) ගුත්තිල මහ සිපී
සක් දෙව් බසින් සැතපී
මින් දිනමැ යි දැපී
බමර තත පළමුවෙන් සිඳපී

(අ) ගුත්තිල පඬිතුමාට සක් දෙව් රජුගෙන් ලැබුණු උපදෙස කුමක් ද?
(ආ) බමර තත යනු කුමක් දැයි ලියන්න (ලකුණු 2 x 10 = 20)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍යන පාඨ කියවා අසා ඇති ප්‍ර ශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) " දේවයන් වහන්ස,නොසිතා වදාළ මැනව,අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති,නුවර ඇතුළේ වලක් නැති හෙයින්..."
(අ) මෙම ප්‍රිකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙහි සඳහන් බලවත් උපාය කුමක් ද?

(ii) " එසේ වී නම් තට රුවියක් හැර ගෙන යව"යි කීය.ඒ තෙමේ මසු දාහ අතට ගත.
(අ) මෙම ප්‍රනකාශය කළේ කවුරුන් ද?
(ආ) එම පුද්ගලයා ළඟ තිබූ අනෙකුත් දේ මොනවා ද?

(iii) " නැඟී සිටුව! ආචාරිනී,නැඟී සිටුව ආචාරිනී,මම බාලයෙමි;තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි.මා නොවඳුව"
(අ) මෙසේ ප්‍රසකාශ කළේ කවුරුන් ද?
(ආ) මෙම සිද්ධියට පෙර සිදු වූයේ කුමක් ද?

(iv) පටන් සුරිඳු දුන් උපදෙස් සිහිකොට
**ඉටන්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
**තුටන් වඩන** සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට
(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.
(ආ) උපදෙස් ක්‍රි යාත්මක කළ පසු සිදු වූ දේ ලියන්න.

(v) පන් සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන **වෙණ නදයෙන් තොස්වූ**
**නන් දන කැන්** දුටුව ද බිය සිස්වූ
මින් රළ වුත් ගං වෙරළට රැස්වූ
(අ) අංකිත පදවල අර්ථ දක්වන්න .
(ආ) මත්ස්‍යන සමූහයා ගං වෙරළට රැස් වූයේ කුමක් සඳහා ද?

(ලකුණු 4 x 5 = 20)

♦ **03,04 ප්‍රශ්නවලට වචන 150 – 200 අතර විය යුතු ය.**

(03) පන්සිය පනස් ජාතක කතාකරුවා උම්මග්ග ජාතකයේ දී මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමට සමත් වන්නේ,

(අ) කේවට්ටගේ යුද උපක්‍රම වියදර්ථ කිරීමට විවිධ උපක්‍රම භාවිත කිරීමේ හැකියාව

(ආ) උපායශීලී ව සුදුසු පරිදි සන්නිවේදන උපක්‍රමඩම යොදා ගැනීමේ දක්ෂතාව නිසා ය.

එක් කොටසකට උදාහරණ **දෙක බැගින්** ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**නැතහොත්**

උම්මග්ග ජාතකය සාර්ථක කතා වස්තුවක් වී ඇත්තේ කතාවට උචිත පරිදි චරිත හසුරුවා ගැනීම නිසා ය.

(අ) වේදේහ රජුගේ හා

(ආ) බ්‍රහ්මදත්ත රජුගේ චරිත ඇසුරෙන් උදාහරණ **දෙක බැගින්** දක්වමින් සාකච්ඡා කරන්න.

(04) (අ) මනුෂ්‍යයන්ගේ ගති ස්වභාවය ද

(ආ) සත්ත්ව සමූහයාගේ ගති ස්වභාවය ද

සාර්ථක ව නිරූපණයකිරීමට ගුත්තිල කවියා සමත් වී ඇත. වීණා වාදනයෙන් එක් කරුණකට නිදසුන් **දෙක බැගින්** දක්වමින් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**නැතහොත්**

(අ) අවස්ථාවට උචිත ලෙස විරිත් භාවිතය ද

(ආ) කාව්‍ය රස තීව්‍රවන සේ උපමා භාවිතය ද

නිසා ගුත්තිල කාව්‍යවය වඩාත් රසවත් වීමට හේතු වී ඇත.එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(05) 'ගුත්තිල කවියා වීණා වාදනයෙහි වශී වූවන්ගේ ප්‍රතිචාර මගින්,වාදනයෙහි අපූර්වත්වය නිරූපණය කරයි.' උදාහරණ **තුනක්වත්** දෙමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(06) 'සුරඟන රඟුම මනහර අයුරින් නිරූපණය කිරීමට වෑත්තෑවේ හිමියන්ට හැකි වූයේ උන් වහන්සේ සතු ප්‍රතිභාශක්තිය නිසා ය.'උදාහරණ **කවි තුනක්** නිදසුන් ගෙන පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(07) 'ජාතක කතාකරුවා හාස්‍ය යෙන් හා උපහාසයෙන් යුක්තව කේවට්ට බමුණාගේ චරිතය නිරූපණය කොට ඇත.' උදාහරණ **තුනක්වත්** ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 10)